# ශ්‍රී ලංකාවේ තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම  සඳහා අදහස් හා යෝජනා ලබා ගැනීම.

## ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සම්බන්ධයෙන්  සියලුම ක්ෂේත්‍ර ආවරණය වන පරිදි ප්‍රතිපත්ති සම්පාදනය සඳහා 1991 අංක 19 දරන පාර්ලිමේන්තු පනත මගින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව ස්ථාපිත කර ඇත. අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින ජාතික අවශ්‍යතා හා ගෝලීය ප්‍රවණතා කෙරෙහි අවධානය ඇතිව ඉදිරි දශකයට උචිත අධ්‍යාපන ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීම සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව ප්‍රතිපත්ති සමාලෝචන ක්‍රියාවලියේ නිරතව සිටී.
ඒ අනුව ශ්‍රී ලංකාවේ තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන පද්ධතිය දියුණු කිරීම උදෙසා එම ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක ප්‍රතිපත්ති හා සැලසුම්වල සිදුකළ යුතු වෙනස්කම් සහ නව ප්‍රතිපත්ති හා යෝජනා පිළිබඳව පොදුජනතාවගෙන්, ආයතනවලින් සහ සංවිධානවලින් අදහස් හා යෝජනා ලබා ගැනීමට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව අපේක්ෂා කරයි.

ඒ සඳහා ලිඛිත යෝජනා පහත දැක්වෙන අංශ යටතේ අප වෙත ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමු.

1. රාජ්‍ය හා පෞද්ගලික අංශ මගින් තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය සැපයීම.
2. මානව,භෞතික හා මූල්‍ය සම්පත් උපයෝජනය.
3. ඇතුළත්වීමේ සුදුසුකම් හා තෝරා ගැනීමේ ක්‍රමවේදය.
4. ඉගැන්වීමේ මාධ්‍යය
5. තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන පාඨමාලාවල ගුණාත්මකභාවය.
6. සාමාන්‍ය අධ්‍යාපනය සහ තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය අතර ඇති සම්බන්ධතාව.
7. තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනයේ නියැලී සිටින උපදේශකයින්, කථිකාචාර්යවරුන් හා අධ්‍යයන සහායකයින් ගේ වෘත්තීය සංවර්ධනය.
8. ශිෂ්‍ය සහභාගිත්වය හා අවබෝධය.
9. තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය සහ එහි පුහුණු ක්ෂේත්‍රයේ පවත්නා පරතරය හා අතිච්ඡාදනය.
10. තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය ක්‍රියාවට නංවන ක්‍රමවේදයන්ගේ පවත්නා සඵලදායීබව හා කාර්යක්ෂමතාව.
11. සේවායෝජකයින් හා කර්මාන්ත අතර ඇති සම්බන්ධතාව.
12. තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන ආයතන අතර සම්බන්ධීකරණය.
13. විවිධ ආබාධ සහිත පුද්ගලයන් සඳහා තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය.
14. තක්සේරුව හා ඇගයීම.
15. තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය  සහ රැකියා අවස්ථාවන් අතර පවත්නා නොගැලපීම.

ලිඛිත යෝජනා 2017 දෙසැම්බර් මස 12වන දිනට පෙර සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, අංක 126, නාවල පාර, නුගේගොඩ. යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් හෝ විද්‍යුත් තැපැල් මගින් හෝ ෆැක්ස් මගින් යොමු කළ හැකිවන අතර ,අතින් ගෙනවිත් ද බාරදිය හැකිය.

කරුණාකර ලියුම් කවරයේ/ආවරණ පිටුවේ වම් පස ඉහළ කෙළවරේ “තdක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා යෝජනා” යනුවෙන් සඳහන් කරන්න.

ලිඛිතව ලබාදුන් අදහස් හා යෝජනා පිළිබඳව තව දුරටත් කරුණු පැහැදිළි කරගැනීමට අවශ්‍ය වුවහොත් වාචිකව අදහස් විමසීමට  කොමිෂන් සභාව විසින් ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

**දැනට පවතින කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පද්ධතිය දියුණු කිරීම උදෙසා වූ ඔබගේ නව නිර්මාණශීලී අදහස් හා ප්‍රවේශයන් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව නිබඳවම අපේක්ෂා කරනු ලබයි.**


ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, 126, නාවල පාර, නුගේගොඩ, ශ්‍රී ලංකාව.

දුරකථන :94112815701-3
ෆැක්ස් :94112816177-8
විද්‍යුත් තැපැල :chnec@slt.lk
වෙබ් අඩවිය :WWW.nec.gov.lk

සභාපති
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව.